# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1967/50 – 2016 මැයි 19 වැනි බ්‍රහස්පතින්දා – 2016.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1324, වැල්පොතුවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උජේකැලේ (අ.ග.පි. 1543) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/KBI/2014/305 හා 2015.10.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මෝදරහේන – ප්‍රමාණය: හෙක්. 0.0280**
උතුරට: දැදුරු ඔය; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: ඇළ; බටහිරට: ඇළ සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

02. **කැබලි අක්ෂර 'බී' – හැළඹගහමුලහේන – ප්‍රමාණය: හෙක්. 0.2274**
උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ඇළ; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

03. **කැබලි අක්ෂර 'සී' – ගල්වැටියවත්ත නොහොත් රොස්ලින් එස්ටේට් – ප්‍රමාණය: හෙක්. 0.2274**
උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ප්‍රාදේශීය සභා මාර්ගය; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: එන්. එම්. එල්. මරික්කාර් හිමිකම් කියන ගල්වැටියවත්ත සහ කැබලි අක්ෂර ඩී; බටහිරට: එන්. එම්. එල්. මරික්කාර් හිමිකම් කියන ගල්වැටියවත්ත සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

04. **කැබලි අක්ෂර 'ඩී' – ගල්වැටියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1369**
උතුරට: ඒ. එල්. ගුණරත්න හිමිකම් කියන ගල්වැටියවත්ත සහ කැබලි අක්ෂර සී; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ප්‍රාදේශීය සභා මාර්ගය; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

05. **කැබලි අක්ෂර 'ඊ' – ගල්වැටියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0925**
උතුරට සහ නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

ජෝන්.ඒ.ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: 4-3/7/2014/HW/223
ඉඩම් අමාත්‍යාංශය,
2016 මැයි මස 03 වැනි දින,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 124


1A – G 23493 – 17 (2016/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*සැ.යු.– මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැකිය.*